# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## වෛද්‍ය (සංශෝධන)

**(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් 2024 ජූලි මස 02 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 මැයි මස 30 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[269 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ 39ආඅ වගන්තිය යටතේ විශේෂඥ වෛද්‍යවරයකු වශයෙන් තාවකාලිකව ලියාපදිංචි වී ඇති සෑම තැනැත්තකුගේ ම නම (1) වන උපවගන්තියේ (අඅ) ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ලේඛනයේ වෙනම කොටසක ඇතුළත් කිරීමෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා රෙජිස්ට්‍රාර්වරයාට හැකි වන පරිදි විධිවිධාන සැලැස්වීම ය.

***3 වන වගන්තිය*** :මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 39ආඅ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එමගින් විශේෂඥ වෛද්‍යවරයකු සඳහා තාවකාලිකව ලියාපදිංචි වීම සඳහා විධිවිධාන සලස්වනු ලබයි.

***4 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, එමගින් 39ආඅ වගන්තිය යටතේ තාවකාලිකව ලියාපදිංචි වී ඇති විශේෂඥ වෛද්‍යවරුන් සඳහා ප්‍රකාශන ආකෘති පත්‍රයක් අලුතින් හඳුන්වා දෙනු ලබයි.

එල්.ඩී.-ඕ. 7/2024

**(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

කෙටි නාමය

**1.** මේ පනත 2024 අංක   දරන වෛද්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

105 වන අධිකාරයේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (5ඈ) වන උපවගන්තියේ "ඉවත් කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "ඉවත් කරනු ලැබිය යුතු ය;'' යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (5ඈ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(5ඉ) 39ආආ වගන්තිය යටතේ විශේෂඥ වෛද්‍යවරයකු වශයෙන් තාවකාලිකව ලියාපදිංචි වීම සඳහා ස්වකීය හිමිකම සනාථ කරනු ලබන සෑම තැනැත්තකුගේ ම නම, රෙජිස්ට්‍රාර්වරයා විසින්, (1) වන උපවගන්තියේ (අආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ලේඛනයේ වෙනම කොටසක ඇතුළත් කරනු ලැබිය යුතු අතර, ඉන්පසු 39ආ වගන්තිය යටතේ විශේෂඥ වෛද්‍යවරයකු වශයෙන් ඒ තැනැත්තා ලියාපදිංචි කරනු ලැබූයේ නම්, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තාගේ නම, විශේෂඥ වෛද්‍යවරුන් වශයෙන් තාවකාලිකව ලියාපදිංචි වී ඇති තැනැත්තන්ගේ නම් ඇතුළත් ඉහත සඳහන් ලේඛනයේ එම කොටසින් ඉවත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 39ආආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 39ආආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:- '

"විශේෂඥ වෛද්‍යවරයකු වශයෙන් තාවකාලිකව ලියාපදිංචි වීම

39ආආ. (1) 39අ වගන්තියේ (4) වන උපවගන්තියේ දක්වා ඇති සුදුසුකම ලබා ඇති යම් තැනැත්තකු විසින්, 39ආ වගන්තිය යටතේ විශේෂඥ වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා වන පූර්ව අවශ්‍යතාවක් වශයෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් නිකුත් කරනු ලබන මණ්ඩල සහතිකය ලබා ගැනීම සඳහා, විශේෂඥ වෛද්‍යවරයකු වශයෙන් තාවකාලිකව ලියාපදිංචි වීම සඳහා වෛද්‍ය සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) එවැනි යම් තැනැත්තකු -

(අ) මනා චරිතයකින් යුක්ත විය යුතු ය; සහ

(ආ) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාර්යය සඳහා පහත දක්වා ඇති ලේඛන ද සමඟ වෛද්‍ය සභාව වෙත ඉල්ලීමක් සිදු කරනු ලැබිය යුතු ය:-

(i) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් නිකුත් කරන ලද වෘත්තියේ නියැලීම සඳහා සුදුසු බවට වන ලිපියක්;

(ii) ශ්‍රී ලංකාවෙන් පිටත එක් ආරෝග්‍යශාලාවක හෝ ඊට වැඩි සංඛ්‍යාවක නේවාසික වෛද්‍ය නිලධරයකු වශයෙන් හෝ විශේෂඥ වෛද්‍යවරයකු වශයෙන් ඉල්ලුම්කරු සේවයේ යෙදී සිටි බවට තහවුරු කරමින් පළපුරුද්ද පිළිබඳ සහතිකය;

(iii) එකී තැනැත්තා උපාධිය ලබාගත් රටේ වෛද්‍ය සභාව සමඟ ලියාපදිංචි වී ඇති බවට තහවුරු කිරීම පිණිස ප්‍රථම උපාධියේ ලියාපදිංචි සහතිකය;

(iv) ඉල්ලුම්කරු විසින් ස්වකීය පශ්චාත් උපාධි සුදුසුකම ලබා ගෙන ඇති රටේ අදාළ බලධරයා විසින් නිකුත් කරන ලද විශේෂඥ සහතිකයේ (මණ්ඩල සහතිකය) පිටපතක්; සහ

(ඇ) වෛද්‍ය සභාව විසින් එම තාවකාලික ලියාපදිංචිය සඳහා නිශ්චය කරනු ලැබිය යුතු ගාස්තු ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි "දෙවන උපලේඛනය" යන වචනවලට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"I වන කොටස"; සහ

(2) එහි දෙවන උපලේඛනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

"II වන කොටස

[39ආඅ වන වගන්තිය]

**තාවකාලික විශේෂඥ වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා වන ප්‍රකාශනය**

ඉල්ලුම්කරු විසින් 39අ වගන්තියේ (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සුදුසුකම දරනු ලබන අවස්ථාවක දී-

(ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය) වන මා පහත පරිදි මෙයින් ප්‍රකාශ කර සිටිමි:-

39අ වගන්තියේ (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සුදුසුකම දරන සහ 39ආ වගන්තිය යටතේ විශේෂඥ වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා පූර්ව අවශ්‍යතාවක් වශයෙන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් නිකුත් කරනු ලබන මණ්ඩල සහතිකය ලබාගැනීම සඳහා මෙම ආඥාපනත යටතේ විශේෂඥ වෛද්‍යවරයකු වශයෙන් තාවකාලිකව ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කරනු ලැබ ඇති, ඉහත නම සඳහන් තැනැත්තා මම වෙමි.

ඉල්ලුම්කරුගේ අත්සන

මා ඉදිරිපිට දී .............................. දින ප්‍රකාශ කරන ලදී.

සාමදාන විනිශ්චයකාර/
දිවුරුම් කොමසාරිස් ".

**5.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව